# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 - 08 - 21

පැමිණිලිකාරිය : ජේ.කේ.ආර්. චන්ද්‍රකාන්ති මිය,
නො 127/1, රිටිගහලන්ද වත්ත,
මාවතගම,
පාදුක්ක.

වගඋත්තරකරුවන් : අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය,
තැපෙ 21, හයිලෙවල් පාර,
මහරගම.

<u>පැමිණිලි අංකය : **HRC/5083/16**</u>

පැමිණිල්ලේ කරුණු සැලකිරීම :-

ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය විසින් 2016.12.22 දාතමින් පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා 1988.07.26 දින ව්‍යාපෘති සහකාර III ශ්‍රේණියේ නිලධාරිනියක ලෙස අධ්‍යාපන අමාත්‍යංශයේ සේවයට එක් වූ බවත්, සේවයට එක්වීමෙන් පසුව තම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වැඩිදියුණු කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකල බවත්ය. ඒ අනුව තමා මේවනවිට ජාතික අධ්‍යාපන ආයතනයේ පාලන නිලධාරි ලෙස කටයුතු කරමින් සිටින බවත්, 2013.03.01 දින සිට ක්‍රියාත්මක ජාතික අධ්‍යාපන ආයතනයේ නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව සිදුකල අන්තර්ග්‍රහන ක්‍රියාවලියේදී සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) යන තනතුර සඳහා පැවති පුරප්පාඩුව සඳහා තමා සුදුසුකම් සපුරා තිබියදී අදාල බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව පැවති පාලනාධිකාරිය කටයුතු කරමින් බාහිරින් වෙනත් සුදුසුකම් රහිත තැනැත්තියක් පුවත්පත් දැන්වීම් පලකර බඳවා ගනු ලැබූ බවත්, මේ සම්බන්ධව ආයතනයේ එවකට පැවති පාලනාධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කල නමුත්, එවකට ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் } 011-2505451
ෆැක්ස් / தொலைநகல் } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் } sechrc@sltnet.lk

විසින් තම අභියාචනය ඉල්ලා අස් කර ගන්නා ලෙස වාචිකව බලපෑම් සිදුකළ බවත්, එවකට පැවති රජයේ දේශපාලන බලය ද යොදාගෙන ඔහු එම තනතුරේ කටයුතු කල බවත්, ඔහුට එරෙහිව කටයුතු කිරීම තමා හෝ වෙනත් සේවකයෙකු මෙම තත්ත්වය තුළ ඉදිරිපත් නොවූ බවත් සඳහන් කර ඇත.

කෙසේ වෙතත්, සහකාර අධ්‍යක්ෂ (පාලන හා මුදල්) තනතුර සඳහා බඳවා ගත් නිලධාරිනියට මේ වනතෙක් එම තනතුරේ අදාල සුදුසුකම් තහවුරු කිරීමට හැකියාවක් ලැබී නොමැති බවත්, ඥාති සබඳතා හා දේශපාලන සබඳතා මත මෙම තැනැත්තිය එම තනතුරට පක්ෂග්‍රාහිව පත් කල අයෙකු බවත් සඳහන් කර ඇත. මෙම අසාධාරණය සිදුවූ මුල් අවධියේ මෙම පැමිණිල්ල ඉදිරිපත් කිරීමට කටයුතු නොකලේ තමාට සහ තම එකම දරුවාට මෙයට සම්බන්ධ නිලධාරින් වෙතින් සිදුවිය හැකි බලපෑම් නිසාවෙන් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව මේ සම්බන්ධව වැඩිදුර විමර්ශනයක් සිදුකර සහනයක් සලසා දෙන ලෙසට මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

තවද, 2013.03.01 දින ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා අනුව නව තනතුරු සඳහා අන්තර්ග්‍රහනය කර ක්‍රියාත්මක කිරීමේදී මුදල් අමාත්‍යංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ලිපියේ 03 වන ඡේදය අනුව කටයුතු නොකරමින් MM - 1 – 3 ශ්‍රේණියේ උසස්වීම් ලබාදීම වෙනුවට තමාට පෞද්ගලික වන සේ වැටුප් ලබාදී තමා පෙර සිටි ශ්‍රේණියේ (JM - 1 – 1– කණිෂ්ඨ කළමණාකරු තනතුරේ පිහිටුවා වසර 10කින් තම සේවය පහත හෙලා ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව ඉහතින් සඳහන් සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුරට තමාව පත් කිරීමට වගඋත්තරකරුට නිර්දේශ ලබාදෙන ලෙසත් තමා වෙනුවට එම තනතුරට නීති විරෝධිව පත් කළ තැනැත්තිය ඉවත් කිරීමට නිර්දේශ ලබාදෙන ලෙසත් ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු සැලකිරීම් :-

මෙම පැමිණිල්ල පිළිබඳව අදාල පරීක්ෂණය සඳහා 2017.05.15 වන දින පැමිණිලිකාරිය සහ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය පරීක්ෂණයට කැඳවා ඇති අතර, අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) එච්.ජේ.යූ.ගුණසේකර මහතා පරීක්ෂණය සඳහා සහභාගි වී ඇත.

මෙම පරීක්ෂණයේදී පැමිණිලිකාරිය විසින් තම මුල් පැමිණිල්ල සහ ඒ සමග ඉදිරිපත් කර ඇති වැඩිමනත් ලේඛන ද අදාල කර ගනිමින් කරුණු ඉදිරිපත් කර ඇත.

මෙහිදී වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකාරිය සඳහන් කරන ආකාරයෙන් මෙම ප්‍රශ්ණගත කාරණයේ දී ඇයට අසාධාරණයක් සිදුව ඇති බව පිළිගනු ලැබ ඇත.

විශේෂයෙන්ම මෙම විෂයගත කාරණයට අදාලව කොමිෂන් සභාව කැඳවා තිබූ වාර්තාව ලබාදීම ප්‍රමාද වූයේ පැමිණිලිකාරිය විසින් සඳහන් කරන තනතුරට බඳවා ගෙන ඇති තැනැත්තියගේ අධ්‍යාපන සුදුසුකම් වලට අදාලව විශේෂයෙන්ම අදාල උපාධි සහතිකය පෞද්ගලික ලිපි ගොනුවට ලබානොදීම හේතුවෙන් බව ප්‍රකාශ කර ඇත. ඇය විසින් ලබාගෙන ඇති බව ප්‍රකාශ කර ඇති උපාධි ප්‍රතිඵල වලට අදාල සනාථ කිරීමක් මේ දක්වා සිදුකර නොමැති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඒ අනුව මෙදින පරීක්ෂණයේදී අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) විසින් අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය විසින් මේ පිළිබඳව ලබාදී ඇති ලිඛිත සැලකිරීම් ද කොමිෂන් සභාව වෙත එදින පරීක්ෂණයේදී ඉදිරිපත් කර ඇත. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ඇය ඉල්ලා සිටින සහනයන් සලසා දීමට නිර්දේශ ලබාදෙන්නේ නම් ඒ අනුව කටයුතු කිරීමට හැකියාවක් ඇති බවයි.

නිරීක්ෂණ :-

දෙපාර්ශවය විසින් විෂයගත කාරණයට අදාලව ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු දැක්වීම් අනුව පහත නිරීක්ෂණ ඉදිරිපත් කළ හැකිය.

- පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කරන පරිදි ඇය 1988.07.26 දින ව්‍යාපෘති සහකාර  සහකාර III ශ්‍රේණියේ ස්ථිර තනතුරකට රාජ්‍ය සේවයට එක්ව ඇති අතර, ඉන් අනතුරුව තම අධ්‍යාපන සහ වෘත්තිය සුදුසුකම් සපුරාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

- 2011.05.14 දින සිට පාලන නිලධාරි (MM 1 – 3) ලෙස උසස්වීම් ලබාගෙන ඇති අතර, 2013.03.01 ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්ග්‍රහන ක්‍රියාවලියක් සිදුව ඇත.

- අදාල අන්තර්ග්‍රහණ ක්‍රියාවලියේදී ඒ වනවිට පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුර ඇයට ලබානොදීම පිළිබඳව ඇය විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය වේ.

- ජාතික අධ්‍යාපන ආයතනයේ ක්‍රියාත්මක වන බඳවා ගැනීමේ පරිපාටිය අනුව ඉහත

තනතුර සඳහා අභ්‍යන්තර සහ බාහිර වශයෙන් සුදුසුකම් සඳහන් කර ඇති අතර, අභ්‍යන්තර අයදුම්කරුවන් නොසලකා හරිමින් බාහිර අයදුම්කරුවෙකු බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පළ කර ඇති බවද නිරීක්ෂණය වේ.

- වගඋත්තර පාර්ශවය සඳහන් කරන ආකාරයට බාහිරින් බඳවාගෙන ඇති තැනැත්තිය අදාළ තනතුරට අදාළව අවශ්‍ය සුදුසුකම් ඒ වනවිට සපුරා නොමැති බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

ජාතික අධ්‍යාපන ආයතනයේ බඳවාගැනීමේ පරිපාටිය සහ ඊට අදාළව 2011.12.22 දාතමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා අනුව පැමිණිලිකාරිය වෙත 2013.03.01 දින වනවිට පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුරට අන්තර්ග්‍රහණය ක්‍රියාත්මක වීමේදී ලබාදිය යුතුව පැවැති බව කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ. එමෙන්ම බඳවා ගැනීම් පටිපාටිය අනුව අභ්‍යන්තර සේවකයන්ට අදාළ තනතුර සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා නොදීම තුළින්ද පැමිණිලිකාරියට අගතියක් සිදුවී ඇති අතර, ඒ බව වගඋත්තර පාර්ශවය විසින් ද පිළිගෙන ඇත. තවද, එම තනතුර සඳහා බාහිරින් බඳවාගෙන ඇති තැනැත්තියට අවශ්‍ය සුදුසුකම් නොමැති බවද වගඋත්තර පාර්ශවය විසින් පිළිගෙන ඇත. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ එවකට පැවති පාලනාධිකාරිය විසින් පැමිණිලිකාරිය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති 'නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණයද, සර්වසාධාරණ විය යුත්තේය' යන වගන්තියේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. ඒ අනුව පැමිණිලිකාරිය වෙත ජාතික අධ්‍යාපන ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුර ලබා දීමට කටයුතු කරන ලෙසද එසේ පත් කිරීමේදී පෙරදාතම් කර අදාළ තනතුරට පත් කිරීම සිදුකර ඇයට හිමි හිඟ වැටුප් සහ දීමනා ආදියද ලබාදීමට කටයුතු කළ යුතු බවද ජාතික අධ්‍යාපන ආයතනයේ පාලනාධිකාරිය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. වගඋත්තර පාර්ශවය විසින් පිළිගෙන ඇති ආකාරයට වර්තමාන සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුර දරණ තැනැත්තිය සුදුසුකම් රහිතව එම තනතුරට බඳවාගෙන ඇති හෙයින් එසේ නීති විරෝධීව ක්‍රියා කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු

පරිදි පරීක්ෂණයක් සිදුකර ඔවුන්ට එරෙහිව විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් අධ්‍යාපන අමාත්‍යංශය වෙත දැනුම් දෙනු ලැබේ.

එහිදී දේශපාලන හෝ වෙනත් බලපෑම් මත වර්තමානයේ එම තනතුර දරණ තැනැත්තිය අදාල තනතුරෙන් පහ කරන්නේ නම් සුදුසුකම් රහිතව ඇය තනතුරු දරමින් වැටුප් හා දීමනා ඇතුළු වරප්‍රසාද ලබා ඇත්නම් ඒ සම්බන්ධයෙන් ඇයට එරෙහිව විනය පියවර ගැනීමට ද කටයුතු කරන ලෙස දන්වනු ලැබේ.

3. මීට අමතරව නීති විරෝධී පත්වීමක් ලබාදී ඇති ජාතික අධ්‍යාපන ආයතනයේ එවකට පාලනාධිකාරියේ අදාල නිලධාරින්ට එරෙහිව විනය පියවර ද ගත යුතුය.

2019.09.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්, - 2 වන හා 3 වන නිර්දේශ අනුව අවශ්‍ය පියවර ගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/